**ශීර්ෂය 192 - නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

---

ශීර්ෂය 192 - නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ජුනි 22 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.1 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙළ කිරීම හා සාධරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලයන 9,438.11 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 8,048.46 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 1,389.65 ක් හෙවත් සියයට 14.72 ක් ඉතිරිවී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2016 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| පුනරාවර්තන | 7,466.72 | 7,042.56 | 424.16 | 5.68 |
| මූලධන | 1,971.39 | 1,005.90 | 965.49 | 48.98 |
| **එකතුව** | **9,438.11** | **8,048.46** | **1,389.65** | **14.72** |

**2.2 අත්තිකාරම් ගිණුම්**

**2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාළ විෂය අංක 19202 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 210.00 | 71.53 | 90.30 | 108.16 | 400.00 | 129.16 |

**2.3 පොදු තැන්පත් ගිණුම්**

අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුමේ ශේෂ එකතුව රු. මිලියන 72.25 ක් විය. විස්තර පහත දැක්වේ.

| **තැන්පත් ගිණුම් අංකය** | **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|
| | රු. මිලියන |
| 6000/0000/00/0002/0141/000 | 4.73 |
| 6000/0000/00/0013/0096/000 | 3.51 |
| 6000/0000/00/0013/0095/000 | 0.02 |
| 6000/0000/00/0001/0101/000 | 1.97 |
| 6000/0000/00/0016/0087/000 | 62.02 |
| **එකතුව** | **72.25** |

**2.4 විගණන නිරීක්ෂණය**

නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙළ කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3.** **ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1** **විසර්ජන ගිණුම**

**3.1.1** **අයවැය විචලනය**

පහත සදහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 33 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.61,270,000 ක ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් උපයෝජනයන් සිදු නොකර සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි.

(ආ) වැය විෂයයන් 20 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදයෙන් සියයට 10 ක සිට සියයට 89 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

(ඇ) වැය විෂයයන් 4 ක් සඳහා පරිපුරක ඇස්තමේන්තු වෙන්කිරීම් මගින් ප්‍රතිපාදන ලබා ගෙන තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසාන වන විට එම ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය පරිපුරක ඇස්තමේන්තු වෙන්කිරීම් ලබා ගත් ප්‍රතිපාදනයෙන් සියයට 23 ක සිට සියයට 90 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

**3.2** **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබද සැසඳුම් ප්‍රකාශය**

විගණනයට ඉදිරිපත් කළ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.3,458,874 ක් වූ අතර, එම හිඟහිටි ණය ශේෂවලින් වර්ෂ 3 කට වැඩි කාලයක සිට පැවත එන එකතුව රු.1,767,022 ක් වූ හිඟහිටි ණය ශේෂ සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අමාත්‍යාංශය විසින් අයකර ගැනිමට අපොහොසත් වී තිබුණි.

**3.3** **වත්කම් කළමනාකරණය**

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සදහන් ඌනතාවයන් අනාවරණය විය.

**නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත වර්ග කර ඇති ආකාරයට විශේෂ කාර්ය බළකා කඳවුරු 03 ක පෙරසවි ගොඩනැගිලි ඉදිකිරීම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය.

| කඳවුර | මුළු වර්ග මීටර් ප්‍රමාණය | වටිනාකම | ඌන උපයෝජිතව පැවති කාලය |
|---|---|---|---|
| | | රු. | |
| මීපිළිමාන | 413.478 | 9,230,855 | වර්ෂ 03 |

| | | | |
|---|---|---|---|
| මස්කෙළිය | 954.180 | 21,301,973 | වර්ෂ 03 |
| තලවකැලේ | 890.568 | 19,881,841 | වර්ෂ 03 |

**3.4 කාර්යසාධනය**

**----------------**

මහජන සාමය ස්ථාවර කිරීම තුළින් සාමකාමී වටපිටාවක් නිර්මාණය කිරීමෙන් දක්ෂිණ ප්‍රදේශයේ සංවර්ධන කාර්යයන් සඳහා උරදෙමින් රටේ සමබර සංවර්ධනයට දායක වීමේ වගකීම ඇතිව 2015 නොවැම්බර් 14 දිනැති අංක 1942/10 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය පිහිටුවා තිබුණි. සමස්ථයක් වශයෙන් අමාත්‍යාංශයේ අරමුණු හා එම අරමුණු කරා ළගාවීම්වලට අදාළ කාර්යසාධනය පහත දැක්වේ.

| **අරමුණු** | **අරමුණු කරා ළගාවීම** |
|---|---|
| රට තුළ ජීවත් වන සෑම පුද්ගලයෙකුටම බියෙන් හා සැකෙන් තොරව ජීවත්විය හැකි සාමකාමී වටපිටාවක් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය හා මග පෙන්වීම සිදු කිරීම. | රට තුළ වාර්තාවන අපරාධ විසඳීමට අවශ්‍ය ප්‍රතිපත්තිමය හා උපාය මාර්ගික මගපෙන්වීම් මත 2014 වර්ෂයේදී 1,180,805 ක් වූ අපරාධ සංඛ්‍යාව 2015 වර්ෂයේදී 1,129,555 ක් දක්වා අඩුවී තිබුණි. එය සමාලෝචිත වර්ෂයේදී අපරාධ වාර්තා වීම් සංඛ්‍යාව 1,155,215 ක් විය. මේ අතරින් වාර්තාවී ඇති බල අපරාධ විසඳීමේ ප්‍රතිශතය 2014, 2015 හා 2016 වර්ෂවලදී පිළිවෙලින් සියයට 58, 32 හා 73 මට්ටමෙහි පැවතුණි.<br><br>ළමයින්ට එරෙහිව වාර්තා වූ අපරාධ ප්‍රමාණයන් මෙන්ම කාන්තාවන්ට එරෙහිව වාර්තා වූ අපරාධ දෙස බැලීමේදී 2014 වර්ෂයේදී වාර්තා වූ අපරාධ සංඛ්‍යාව 14,302 ක් වූ අතර 2015 වර්ෂයේදී එය 14,199 ක් දක්වා අඩු වී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී වාර්තා වූ එම සංඛ්‍යාව 14,717 ක් විය. වාර්තා වන අපරාධ විසඳීමේ ප්‍රතිශතය 2014, 2015 හා 2016 වර්ෂවලදී පිළිවෙලින් සියයට 42 ක, 68 ක හා 56 ක මට්ටමේ පැවතුණි |
| අන්තරායකාරී ඖෂධ භාවිතය වැලැක්වීමට හා පාලනයට සහාය වීම. | නිද්‍රා ජනක ද්‍රව්‍ය අත්අඩංගුවට ගැනීම් ප්‍රමාණය 2014, 2015 හා 2016 වර්ෂවලදී පිළිවෙලින් කිලෝ ග්‍රෑම් 11,117 ක්, 13,548 ක් හා 38,872 ක් වී තිබුණි. මේ අතරින් ගංජා, කොකේන් හා හෙරොයින් වැනි නිද්‍රා ජනක ද්‍රව්‍ය අත් අඩංගුවට ගැනීම් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී විශාල ලෙස ඉහළ යාම තුළින් රට තුළ නිද්‍රා ජනක ද්‍රව්‍ය සංසරණය වීමේ ප්‍රවනතාවයක් පැවතීම ද අනාවරණය විය. |

| | |
|---|---|
| ගමනාගමනය පහසු කිරීම සඳහා රථවාහන හැසිරවීම හා මාර්ග තදබදය අවම කිරීම පිළිබද නීති රීති සැකසීම. | රටෙහි ගමනාගමනයට යොදාගෙන ඇති වාහන ප්‍රමාණයේ සීඝ්‍ර වර්ධනයක් සිදුවෙමින් පවතින අවදියක ඊට සමානුපාතිකව වාහන අනතුරු ප්‍රමාණය වර්ධනය වීමේ වේගය පාලනය කර තිබුණි. |

| වර්ෂය | මුළු අනතුරු සංඛ්‍යාව | වාහන සංඛ්‍යාව | වාහන 1000 කට අනතුරු සංඛ්‍යාව |
|---|---|---|---|
| 2014 | 36,050 | 5,633,234 | 6 |
| 2015 | 36,918 | 6,302,141 | 6 |
| 2016 | 39,086 | 6,795,469 | 6 |

නමුත් ඉහත තෙවසරක කාලය තුළ සිදුවී තිබුණු මාරක අනතුරු, බරපතල හා මාරක අනතුරු වලින් සිදු වූ මරණ සංඛ්‍යාව වැඩි වී තිබුණි.

| විස්තරය | 2014 | 2015 | 2016 |
|---|---|---|---|
| මාරක අනතුරු | 2,260 | 2,600 | 2,824 |
| බරපතල අනතුරු | 7,071 | 8,186 | 8,148 |
| මියගිය සංඛ්‍යාව | 2,440 | 2,816 | 3,003 |

| | |
|---|---|
| දකුණු පළාත තුළ යටිතල පහසුකම් සංවර්ධනයට අදාළ සම්බන්ධීකරණ කටයුතු | සමාලෝචිත වර්ෂයේදී ගාල්ල, මාතර, හම්බන්තොට දිස්ත්‍රික්කවල අනුමත කළ සංවර්ධන ව්‍යාපෘති පිළිවෙලින් 86 ක්, 519 ක්, හා 84 ක් වශයෙන් එකතුව 689 ක් වී තිබුණි. වැඩ අවසන් කළ ව්‍යාපෘති ගණන ගාල්ල 66 ක්, මාතර 347 ක් හා හම්බන්තොට 83 ක් වශයෙන් එකතුව 496 ක් වී තිබුණි. මෙම ව්‍යාපෘති සඳහා රු. මිලියන 864.69 ක ප්‍රතිපාදන සලසා තිබුණද රු. මිලයන 381.65 ක් ඉතිරි වී තිබුණි. |
| දකුණු පළාත් සංවර්ධන මණ්ඩලය ස්ථාපිත කිරීම. | දක්ෂිණ සංවර්ධන මණ්ඩලය විධිමත්ව ස්ථාපිත කරනු ලබන තෙක් අතුරු මණ්ඩලයක් ලෙස ක්‍රියා කිරීම පිණිස එම අතුරු මණ්ඩලයේ සාමාජිකයින් පත් කිරීම අවශ්‍ය කාර්ය මණ්ඩලය පත් කිරීම සහ අදාළ පහසුකම් සැලසීම සඳහා වන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවට 2016 මාර්තු 30 දින අනුමැතිය ලැබී තිබුණි. ඊට අදාළ කටයුතු පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. |

(i) දකුණු පළාත් සංවර්ධන මණ්ඩලය ස්ථාපිත කිරීම 2017 මැයි 31 දින වන විටත් සිදු කර නොතිබුණි.

(ii) අතුරු මණ්ඩල කාර්යාලයේ බදු කුලිය ලෙස සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 16.77 ක් හා වෙනත් වියදම් ලෙස රු. මිලියන 5.22 ක් වැය කර තිබුණත් දක්ෂිණ සංවර්ධන කටයුතු ඉටු කිරීමට අදාළව ප්‍රමාණාත්මක කාර්යසාධනයක් සිදුව කර නොතිබුණි.

## 3.5 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 89 | 65 | 24 |
| (ii) | තෘතියික මට්ටම | 352 | 241 | 111 |
| (iii) | ද්වීතියික මට්ටම | 10,463 | 7,743 | 2,720 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 669 | 580 | 89 |
| | **එකතුව** | **11,573** | **8,629** | **2,944** |